# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1887/2 - 2014 නොවැම්බර් මස 03 වැනි සඳුදා - 2014.11.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

මගේ අංකය : 01/10/03/04.

### ඌව පළාතේ පළාත් සභාව

### ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරන ලද පත්කිරීම්

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව, ඌව පළාත් ආණ්ඩුකාරවර ගරු සී. නන්ද මැතිව් මැතිතුමා විසින් පහත සඳහන් පත්කිරීම් සිදු කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

1. ආයුර්වේද වෛද්‍ය සේවයේ I ශ්‍රේණියේ නිලධාරී වෛද්‍ය පී. ඩබ්. ඩබ්. දිසානායක මහතා, 2014 ජූලි මස 07 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, තම නිත්‍ය තනතුරට අතිරේකව බිබිල මැදගම ආයුර්වේද රෝහලේ වෛද්‍ය අධිකාරී තනතුරේ වැඩ බැලීමට,

2. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරී ඩබ්. එම්. නිමල් වීරසිංහ මහතා 2014 අගෝස්තු මස 14 වැනි දින සිට ඌව පළාත් අධ්‍යාපන හා පළාත් පාලන අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (අධ්‍යාපන) තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ 2015 අගෝස්තු මස 13 වැනි දින හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් එම තනතුරේ කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට,

3. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරිනි ඥානා රත්නායක මහත්මිය 2014 අගෝස්තු මස 29 වැනි දින සිට බදුල්ල මහා නගර සභාවේ නාගරික කොමසාරිස් තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ 2014 දෙසැම්බර් මස 31 වැනි දින හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් එම තනතුරේ කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට,

4. ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ආර්. එම්. පී. රත්නායක මහතා, 2014 සැප්තැම්බර් මස 20 දින සිට 2014 සැප්තැම්බර් මස 24 දින දක්වා විදේශ ගත වන බැවින්, 2014 සැප්තැම්බර් මස 20 දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වන පන්තියේ නිලධාරී ආර්. එම්. ආනන්ද රත්නායක මහතා, තම නිත්‍ය තනතුරට අතිරේක ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ආවරණය කිරීමට,

එච්. එම්. සෝමතිලක,
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්.

බදුල්ල, රජවීදියේ,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

11- 476

1A - PG 2234 — 50 (2014/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*